
# පාර්ලිමේන්තු විත්ති

පුවත් හසුන
1 වන කාණ්ඩය
ජූලි 2020



02 පාර්ලිමේන්තු පුස්තකාලයේ ලේඛන පිටු දසලක්ෂ 03ක් ඩිජිටල් තාක්ෂණයෙන් සංරක්ෂණයට

03 පාර්ලිමේන්තු කාරක සභා රැස්වීම් ඩිජිටල් තාක්ෂණය මඟින් පැවැත්වීම සඳහා අවධානය

05 අටවැනි පාර්ලිමේන්තුව සහ එහි විශේෂිත අවස්ථා


07 ‘දෙමුහුන්’ආකෘතියේ රැස්වීම් පවත්වමින් බ්‍රිතාන්‍ය පාර්ලිමේන්තුව ඓතිහාසික පියවරක් ගනී

08 පාර්ලිමේන්තුවේ බලාධිකාරයේ සහ ප්‍රෞඪත්වයේ සංකේතය - සෙංකෝලය

09 පාර්ලිමේන්තු පනතක් සම්මත කිරීමේ ක්‍රමවේදය

12 ඔබ හැන්සාඩ් වාර්තාව ගැන දැනුවත් ද?

සන්නිවේදන දෙපාර්තමේන්තුව
ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව




# පාර්ලිමේන්තු පුස්තකාලයේ ලේඛන පිටු දසලක්ෂ 03 ඩිජිටල් තාක්ෂණයෙන් සංරක්ෂණයට

ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ පුස්තකාලය සතු ඉපැරණි වටිනා ලේඛන ඩිජිටල්කරණය කිරීමේ ව්‍යාපෘතිය යටතේ 1880 සිට නිකුත් කරන ලද විවිධ ලේඛන පිටු දස ලක්ෂ 03ක් සංරක්ෂණය කර තිබේ.

මේ යටතේ පාර්ලිමේන්තුව මඟින් (ප්‍රකාශිත) ප්‍රකාශයට පත් කළ සභා වාර්තා, ස්ථාවර නියෝග, හැන්සාඩ් වාර්තා, කාර්ය සටහන් මෙන්ම රජය මඟින් ප්‍රකාශිත ගැසට් නිවේදන, සිවිල් වාර්තා, සැසි වාර්තා, මැතිවරණ ප්‍රතිඵල, පරිපාලන නිල වාර්තා ඇතුළු ලේඛන ඩිජිටල් තාක්ෂණයෙන් සංරක්ෂණය කර ඇත.

මෙම ඇතැම් ලේඛන මේ වන විට වසර සිය ගණනක් පැරණි බැවින් විනාශ වීමේ අවදානමකට ලක්ව තිබූ අතර නවීන මෘදුකාංග තාක්ෂණය යොදාගනිමින් විශේෂ තත්ත්ව පරීක්ෂාවක් යටතේ පරිගණකගත කිරීම සිදු කළ බව පාර්ලිමේන්තු මහලේකම් ධම්මික දසනායක මහතා ප්‍රකාශ කළේය.

දේශපාලන විද්‍යා විෂය සම්බන්ධයෙන් විශිෂ්ට දැනුම් කෝෂ්ඨාගාරයක් ලෙස සැලකෙන පාර්ලිමේන්තු පුස්තකාලයේ පැරණි, අගනා ලේඛන රාශියක් මෙමඟින් අනාගතයේ ඕනෑම අවස්ථාවක භාවිත කළ හැකි වන පරිදි සුරක්ෂිත වන අතර නවීන, සුහුරු තාක්ෂණික ක්‍රමවේදයන් ඔස්සේ පහසුවෙන් පරිශීලනය කිරීමට, ක්ෂණිකව සොයා ගැනීමට මෙන්ම හුවමාරු කිරීමේ හැකියාවද හිමි වන බව මහලේකම්වරයා වැඩිදුරටත් පැවසීය.

මෙම ව්‍යාපෘතිය යටතේ මූලිකව පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට සහ කාර්ය මණ්ඩලයට මෙම සේවාව ලබා ගත හැකිවන අතර ඉදිරියේදී සාමාන්‍ය ජනතාවටද


> **“ පාර්ලිමේන්තුව මඟින් ප්‍රකාශයට පත් කළ සභා වාර්තා, ස්ථාවර නියෝග, හැන්සාඩ් වාර්තා, කාර්ය සටහන් මෙන්ම රජය මඟින් ප්‍රකාශිත ගැසට් නිවේදන, සිවිල් වාර්තා, සැසි වාර්තා, මැතිවරණ ප්‍රතිඵල, පරිපාලන නිල වාර්තා ඇතුළු ලේඛන ඩිජිටල් තාක්ෂණයෙන් සංරක්ෂණය කර ඇත.**

පාර්ලිමේන්තු වෙබ් අඩවිය හරහා මෙම ලේඛන පරිශීලනය කිරීමේ අවස්ථාව උදාවනු ඇත. එම කටයුතු සැලසුම් කිරීම සඳහා කමිටුවක් මේ වනවිට පත්කර ඇත.

පාර්ලිමේන්තු මන්ත්‍රීවරයන්ගේ තොරතුරු අවශ්‍යතා සපුරාලීම සඳහා පරිශීලනයට වෙන්වූ විවිධ විෂයානුබද්ධ ග්‍රන්ථ හා ලේඛන රැසක් අන්තර්ගත පාර්ලිමේන්තු පුස්තකාලය නවීන සන්නිවේදන උපකරණවලින් හා අන්තර්ජාල පහසුකම්වලින් ද සමන්විතය.

දේශපාලන විද්‍යාව, ජාත්‍යන්තර කටයුතු, ආර්ථිකය, නීතිය, රාජ්‍ය පරිපාලනය, සමාජ සුභසාධනය, අධ්‍යාපනය, ඉතිහාසය, භූගෝලය හා ආගම ආදී විෂයයන්ට විශේෂ අවධාරණයක් සහිතව සියලුම දැනුම් ක්ෂේත්‍ර ආවරණය වන පරිදි සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි යන ත්‍රෛභාෂාවෙන්ම යුක්ත ග්‍රන්ථ වලින් පුස්තකාලය සමන්විතය.

# පාර්ලිමේන්තු කාරක සභා රැස්වීම් ඩිජිටල් තාක්ෂණය මඟින් පැවැත්වීම සඳහා අවධානය



**කෝවිඩ් 19 (COVID 19) අභියෝගයට මුහුණදීම සඳහා රජය විසින් පනවා ඇති සමාජ දුරස්ථභාවයට අදාළ රෙගුලාසි තවදුරටත් ක්‍රියාත්මක වන්නේ නම් ඉදිරි මහ මැතිවරණයෙන් පසු පැවැත්වෙන පාර්ලිමේන්තු කාරක සභා රැස්වීම් සඳහා ඩිජිටල් තාක්ෂණය යොදා ගනිමින් වර්චුවල් (Virtual) රැස්වීම් පැවැත්වීමට අවධානය යොමු කර ඇත.**

කෝවිඩ් 19 අභියෝගයට මුහුණ දෙමින් ලෝකයේ අනෙකුත් රටවල පාර්ලිමේන්තු රැස්වීම් වර්චුවල් (Virtual) රැස්වීම් ලෙස පැවැත්වීම සඳහා යොදා ඇති පියවර විශේෂයෙන් බ්‍රිතාන්‍ය මන්ත්‍රී මණ්ඩලයේ රැස්වීම් පවත්වන ආකෘතිය අධ්‍යයනය කිරීමට පියවර ගෙන ඇති බව පාර්ලිමේන්තුවේ මහ ලේකම් ධම්මික දසනායක මහතා පැවසීය.

සමාජ දුරස්ථභාවයට අදාළ මාර්ගෝපදේශකයන් අනුගමනය කරමින් පාර්ලිමේන්තු කාරක සභා රැස්වීම් පැවැත්වීම පිළිබඳ යෝජිත ක්‍රමවේද නව වන පාර්ලිමේන්තුවට තේරී පත්වන මන්ත්‍රීවරුන් නියෝජනය කරනු ලබන පක්ෂ නායකයන් සමග සාකච්ඡා කරන බවද දසනායක මහතා ප්‍රකාශ කළේය.

නව තාක්ෂණය යොදා ගනිමින් කාරක සභා රැස්වීම් පැවැත්වීමේදී යම් යම් ස්ථාවර නියෝග සංශෝධනය කිරීමට සිදුවිය හැකි බවත්, එසේ කිරීමට අභිනව පාර්ලිමේන්තුවට පත්වන මන්ත්‍රීවරයන් සහ පක්ෂ නායකයන්ගේ කැමැත්ත ලබා ගත යුතු බවත් මහලේකම්වරයා පැවසීය.

බ්‍රිතාන්‍ය පාර්ලිමේන්තුව ඇතුළු ලොව පුරා පාර්ලිමේන්තු ගණනාවක් මේ වනවිට ඩිජිටල් තාක්ෂණය ඔස්සේ zoom වැනි තාක්ෂණික මෙවලම් උපයෝගී කරගනිමින් රැස්වීම් හා කමිටු රැස්වීම් පවත්වන අතර මෙම දෙමුහුන් (Hybrid) පාර්ලිමේන්තු ක්‍රමය දැනටමත් ඔවුන් අතර ජනප්‍රිය වෙමින් පවතී.

මේ වන විට බ්‍රිතාන්‍ය පාර්ලිමේන්තුවෙහි එරට සමාජ දුරස්ථභාවයට අදාළ රෙගුලාසීන්ට අනුව සභා ගර්භය තුළ මන්ත්‍රීවරුන් 50 දෙනෙක්ට පමණක් ආසන පනවා ඇති අතර, තවත් මන්ත්‍රීවරුන් 120 දෙනෙකුට ඩිජිටල් තාක්ෂණය ඔස්සේ පාර්ලිමේන්තු රැස්වීම් වලට එක්වීමේ අවස්ථාව සලසා තිබේ.



# සෞඛ්‍යාරක්ෂිත පාර්ලිමේන්තුවක් සඳහා සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල් සමඟ සාකච්ඡා

මහ මැතිවරණයෙන් පසු පාර්ලිමේන්තුව රැස්වන අවස්ථාවේදී සෞඛ්‍යාරක්ෂිත ක්‍රමවේදයන්ට අනුගත වෙමින් සැසිවාර පැවැත්වීමට ගතයුතු ක්‍රියාමාර්ග පිළිබඳ සාකච්ඡා කර උපදෙස් ලබා දීම සඳහා සෞඛ්‍ය අමාත්‍යාංශයේ නිලධාරීන් පිරිසක් පාර්ලිමේන්තුවට එවීමට කටයුතු කරන බව සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල් විශේෂඥ වෛද්‍ය අනිල් ජාසිංහ මහතා පැවසීය.

ඒ මහතා මේ බව පැවසුවේ පාර්ලිමේන්තුවේ මහලේකම් ධම්මික දසනායක, කාර්ය මණ්ඩල ප්‍රධාන සහ නියෝජ්‍ය මහලේකම් කාර්ය මණ්ඩල ප්‍රධානී නීල් ඉද්දවල යන මහත්වරුන් ඇතුළු පාර්ලිමේන්තුවේ දෙපාර්තමේන්තු ප්‍රධානීන් පිරිසක් සෞඛ්‍ය අමාත්‍යාංශයේදී හමුවූ අවස්ථාවේදීය.

පාර්ලිමේන්තු මැතිවරණයෙන් පසු ඉතා කඩිනමින් පාර්ලිමේන්තුව රැස්වීමට නියමිතව ඇති බැවින් අභිනව පාර්ලිමේන්තුවේ කටයුතු සෞඛ්‍යාරක්ෂිතව පැවැත්වීමට අදාළව ගතයුතු ක්‍රියාමාර්ග පිළිබඳ සාකච්ඡා කිරීම සඳහා මෙම හමුව පැවැත්විණි.

මෙහිදී අදහස් දැක්වූ පාර්ලිමේන්තුවේ මහලේකම් ධම්මික දසනායක මහතා පැවසුවේ පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග අනුව පාර්ලිමේන්තු මැතිවරණයෙන් පසු පාර්ලිමේන්තුව රැස්වන ප්‍රථම දිනයේදී නව කථානායකවරයා තෝරාපත්කර ගැනීම සහ නව මන්ත්‍රීවරුන් දිවුරුම්දීම සඳහා සියලුම මන්ත්‍රීවරුන් සභාගර්භය තුළ සිටීම අත්‍යවශ්‍ය වන බවයි. අනතුරුව ඉදිරි රැස්වීම් පැවැත්විය යුතු ආකාරය මන්ත්‍රීවරුන්ට තීරණය කළ හැකි බවද මහලේකම්වරයා පැවසීය.

එබැවින් පළමු පාර්ලිමේන්තු රැස්වීමේ සිට පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් මෙන්ම පාර්ලිමේන්තු කාර්ය මණ්ඩලයද සෞඛ්‍යාරක්ෂිතව කටයුතු කළ යුතු බැවින් ඒ සඳහා සෞඛ්‍ය බලධාරීන්ගෙන් නිසි උපදෙස් ලබා ගැනීම ඉතා අත්‍යවශ්‍ය බවද දසනායක මහතා මෙහිදී පැවසීය.

මේවන විට සමාජ දුරස්ථභාවය, දෑත් පවිත්‍රකරණය, ශරීර උෂ්ණත්වය මැන බැලීම ඇතුළු සියලු සෞඛ්‍යාරක්ෂිත ක්‍රමවේදයන්ට අනුකූලව පාර්ලිමේන්තු පරිශ්‍රය තුළ සියලු කටයුතු සිදු කරන බවත් කාර්ය මණ්ඩල දැනුවත් කිරීම් ඇතුළු රැස්වීම් සියල්ලක්ම පාහේ ඔන්ලයින් ක්‍රමයට පවත්වන බවත් ඒ මහතා පැවසීය.

මෙහිදී අදහස් දැක්වූ සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල් විශේෂඥ වෛද්‍ය අනිල් ජාසිංහ මහතා පවසා සිටියේ මේ වන විට ශ්‍රී ලංකාවේ  කොවිඩ් වෛරසය ඉතා හොඳින් පාලනය වී තිබුණද විදේශ රටවල සිට මෙරටට පැමිණෙන තැනැත්තන්ගෙන් වෛරසය රට තුළට පැමිණ ව්‍යාප්තවීමේ අවදානම පහව ගොස් නොමැති බැවින් ඉදිරියටත් සෞඛ්‍යාරක්ෂිත ක්‍රමවේද අනිවාර්යෙන්ම අනුගමනය කළ යුතු බවයි.

මේ අනුව ඉදිරි දිනකදී නියෝජ්‍ය  සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල් විශේෂඥ වෛද්‍ය ලක්ෂ්මන් ගම්ලත් ඇතුළු කණ්ඩායමක් පැමිණ පාර්ලිමේන්තුවේ සභාගර්භය, කාරක සභා ශාලා, ආපන ශාලා ඇතුළු අනෙකුත් ස්ථාන නිරීක්ෂණයෙන් පසු  අදාළ සෞඛ්‍යාරක්ෂිත උපදෙස් ලබා දීමට අපේක්ෂා කරන බව ද හෙතෙම වැඩිදුරටත් සඳහන් කළේය.

කොවිඩ් 19 තත්ත්වය පාලනයට අදාළ මාර්ගෝපදේශ සහිත පොත් කට්ටල පාර්ලිමේන්තුව වෙත ප්‍රදානය කිරීමද මෙහිදී සිදුවිය.

# 8 වැනි පාර්ලිමේන්තුව සහ එහි විශේෂිත අවස්ථා

අටවැනි පාර්ලිමේන්තුව එක්සත් ජාතික පක්ෂය UNP (ආසන 106), එක්සත් ජනතා නිදහස් සන්ධානය - UPFA (ආසන 95), ඉලංගෙයි තමිල් අරසු කච්චි - ITAK (ආසන 16), ජනතා විමුක්ති පෙරමුණ - JVP (ආසන 06), ඊලාම් ජනතා ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂය - EPDP (ආසන 01) සහ මුස්ලිම් කොංග්‍රසය (ආසන 01) යනාදී වශයෙන් පිළිගත් දේශපාලන පක්ෂ හය (06) කින් සංයුක්ත විය. තවද, නවක මන්ත්‍රීවරයන් 62ක්ද, පාර්ලිමේන්තු මන්ත්‍රීවරියන් 12ක්ද ඊට ඇතුළත් වූහ.

පෙර කිසිදා නොවූ විරූ ආකාරයට අග්‍රාමාත්‍ය ධූරය සිව් වතාවකදී වෙනස් වූ අතර, පාර්ලිමේන්තුවේ විරුද්ධ පාර්ශ්වයේ නායක ධූරය තිදෙනෙකු විසින් දරන ලදී. එය පහත සඳහන් ආකාරයට සංක්ෂිප්ත කළ හැකි ය :-

■ ගරු රනිල් වික්‍රමසිංහ මහතා-2015.08.24 දින සිට 2018.10.25 දින දක්වාද, නැවත 2018.12.16 දින සිට 2019.11.20 දින දක්වා දෙවතාවකදී ද,

■ ගරු මහින්ද රාජපක්ෂ මහතා-2018.10.26 දින සිට 2018.12.15 දින දක්වා ද, නැවත 2019.11.21 දින සිට මේ දක්වා දෙවතාවකදී ද අග්‍රාමාත්‍යධූරය දරන ලදී.

■ ගරු රාජවරෝදියම් සම්පන්ධන් මහතා, 2015.09.03 දින සිට 2018.12.17 දින දක්වා ද,

■ ගරු මහින්ද රාජපක්ෂ මහතා- 2018.12.18 දින සිට 2019.11.21 දින දක්වා ද,

■ ගරු සජිත් ප්‍රේමදාස මහතා-2020.01.03 දින සිට 2020.03.02 දින දක්වා ද, පාර්ලිමේන්තුවේ විරුද්ධ පාර්ශ්වයේ නායක ධූරය දරන ලදී.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 46(4) ව්‍යවස්ථාව අනුව එක්සත් ජාතික පක්ෂය සහ එක්සත් ජනතා නිදහස් සන්ධානය එකතුව ජාතික ආණ්ඩුවක් පිහිටුවන ලද අතර, ඊට අදාළ යෝජනා සම්මතය පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 47 ප්‍රකාරව ඡන්ද විමසීමකින් ඊට පක්ෂව ඡන්ද 143ක්ද, විපක්ෂව ඡන්ද 16ක්ද වශයෙන් ප්‍රකාශිතව පාර්ලිමේන්තුව විසින් 2015 සැප්තැම්බර් මස 03 වැනි දින අනුමත කරන ලදී.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 41අ(1)(ඉ), (4) සහ (5) අනු ව්‍යවස්ථාවන් අනුව 2015 සැප්තැම්බර් 22 වැනි දින පාර්ලිමේන්තුවේ යෝජනා සම්මතයෙන් ආචාර්ය අහන්ගමගේ ටියුඩර් ආරියරත්න මහතා, ෂිබ්ලි අසීස් මහතා සහ ආචාර්ය රාධිකා කුමාරස්වාමි මහත්මිය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවට පාර්ලිමේන්තු මන්ත්‍රීවරයන් නොවන සාමාජිකයන් වශයෙන් පත් කිරීම අනුමත කරන ලදී.

එවකට තිබූ උපදේශක කාරක සභා අත්හිටුවමින් පාර්ලිමේන්තුවේ ආංශික අධීක්ෂණ කාරක සභා 16ක් සහ රජයේ මුදල් පිළිබඳ කාරක සභාව ස්ථාපිත



කිරීමට වෙන් වශයෙන් යෝජනා සම්මතයන් දෙකක් 2015 දෙසැම්බර් මස 19 වැනි දින පාර්ලිමේන්තුව විසින් අනුමත කර ඒවායේ ක්‍රියාකාරිත්වය ආරම්භ කර ඒවා නව ස්ථාවර නියෝගවලට ඇතුළත් කෙරිණ.

රජයේ මුදල් පිළිබඳ කාරක සභාවේ සභාපතිවරයා විරුද්ධ පාර්ශ්වයේ මන්ත්‍රීවරයෙකු විය යුතු ය. ඒ ඒ ආංශික අධීක්ෂණ කාරක සභාවල සභාපතිවරුන් වශයෙන් ආණ්ඩු පාර්ශ්වයේ සහ විරුද්ධ පාර්ශ්වයේ මන්ත්‍රීවරුන් විසින් කටයුතු කරන ලදි

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 91(1)(ඈ)(xiii) ව්‍යවස්ථාව පරිදි අටවැනි පාර්ලිමේන්තුවේ ගාල්ල මැතිවරණ කොට්ඨාසයේ පාර්ලිමේන්තු මන්ත්‍රිනී ගරු ගීතා සමන්මලී කුමාරසිංහ මහත්මියට පාර්ලිමේන්තු මන්ත්‍රීවරියක වශයෙන් තෝරා පත්කර ගනු ලැබීමට හෝ පාර්ලිමේන්තුවේ අසුන් ගැනීමට සහ පාර්ලිමේන්තුවේදී ඡන්දය දීමට හෝ සුදුසුසෙකු නොවන බවට අංක 362/2015 දරන රිට් අයදුම්පත්‍රය සම්බන්ධයෙන් අභියාචනාධිකරණය විසින් 2017 මැයි මස 03 වැනි දින ප්‍රකාශයට පත් කරන ලද තීන්දුව අභියෝගයට ලක් කරමින් ශ්‍රේෂ්ඨාධිකරණයට ඉදිරිපත් කරන ලද අභියාචනා පෙත්සම සලකා බැලීමෙන් අනතුරුව අභියාචනාධිකරණය විසින් ප්‍රකාශයට පත්කරන ලද තීන්දුව 2017 නොවැම්බර් මස 02 වැනි දා ශ්‍රේෂ්ඨාධිකරණය විසින් ස්ථිර කරමින් අභියාචනා පෙත්සම නිෂ්ප්‍රභ කර ඇති බැවින් එකී මන්ත්‍රීතුමියගේ මන්ත්‍රී ධුරය අවසන් කරන ලද බව කථානායකවරයා විසින් 2017 නොවැම්බර් මස 09 වැනි දින පාර්ලිමේන්තුවේදී නිවේදනය කරන ලදි.

1978 හඳුන්වා දෙනු ලැබූ ස්ථාවර නියෝග 1993 දක්වා වරින් වර සංශෝධනය කරමින් තිබූ අතර අවශ්‍ය ආනුෂංගික සංශෝධන සහ අලුත් වගන්ති එකතු කරමින් සම්පාදිත පාර්ලිමේන්තුවේ නව ස්ථාවර නියෝග 2018 මාර්තු මස 07 වැනි දින පාර්ලිමේන්තුව විසින් අනුමත කර 2018 අප්‍රියෙල් 15 වැනි දින සිට ක්‍රියාත්මක කරන ලදි (https://www.parliament.lk/si/how-parliament-works/standing-orders).

පාර්ලිමේන්තු මන්ත්‍රීවරයන් සඳහා වන චර්යා ධර්ම සංග්‍රහයක්ද 2018 මාර්තු මස 07 වැනි දින පාර්ලිමේන්තුව විසින් අනුමත විය.

2018 නොවැම්බර් මස 09 වැනි දින සිට බලපවත්වන පරිදි අටවැනි පාර්ලිමේන්තුව විසුරුවමින් අභිනව පාර්ලිමේන්තුව 2019 ජනවාරි මස 17 වැනි දින රැස්වන ලෙස කැඳවමින් ද, මහ මැතිවරණය 2019 ජනවාරි මස 05 වැනි දින පැවැත්වීමටද, නියම කරමින් එවකට සිටි ජනාධිපතිවරයා විසින් ප්‍රකාශනයක් නිකුත් කරන ලදී.

අටවැනි පාර්ලිමේන්තුව කලින් විසුරුවා හරිමින් 2018 නොවැම්බර් මස 09 වැනි දින එවකට සිටි ජනාධිපතිවරයා විසින් නිකුත් කරන ලද අංක 2096/70 දරන අති විශේෂ ගැසට් නිවේදනය ශූන්‍ය හා අවලංගු කරමින්, ඊට නීතිය ඉදිරියේ බලපෑමක් නොමැති බවට ප්‍රකාශයට පත් කරමින් ශ්‍රේෂ්ඨාධිකරණයේ සත් පුද්ගල විනිසුරු මඬුල්ලක් විසින්, එකී මඬුල්ලේ විනිසුරුවරුන් හය දෙනෙකු විසින් ද, එක් විනිසුරුවරයෙකු විසින්ද, වෙන් වශයෙන් එකම තීන්දුව මඟින් ඒකමතිකව තීරණය කරන ලදී.

අටවැනි පාර්ලිමේන්තු කාලය තුළදී, 2018 ඔක්තෝබර් මස 26 වැනි සිකුරාදා සිට 2018 දෙසැම්බර් මස 16 වැනි දින දක්වා දින 52 ආණ්ඩුවක් පැවතිණි.

අභිනව ජනාධිපතිවරයා 2019 නොවැම්බර් මස පත්වීමත් සමඟ එක්සත් ජනතා නිදහස් සන්ධානය නියෝජනය කළ විපක්ෂය විසින් අමාත්‍ය මණ්ඩලය වශයෙන් දිවුරුම් දීමෙන් අනතුරුව නව ආණ්ඩුවක් පිහිටුවන ලදි.

සභාවාර හතරකින් සමන්විත වූ අටවැනි පාර්ලිමේන්තුව 2020 මාර්තු මස 02 වැනි දින විසුරුවා හැරිණ.



එච්. ඊ. ජනකාන්ත සිල්වා,
සහකාර අධ්‍යක්ෂ (පරිපාලන),
සභා ලේඛන කාර්යාලය,
ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව

විශේෂාංග

# 'දෙමුහුන්' ආකෘතියේ රැස්වීම් පවත්වමින් බ්‍රිතාන්‍ය පාර්ලිමේන්තුව ඓතිහාසික පියවරක



කෝවිඩ්-19 වසංගත තත්ත්වය හමුවේ මන්ත්‍රීවරුන් 50 දෙනෙකු පමණ දැඩි සමාජ දුරස්ථ නීතිරීති යටතේ සභා ගර්භයේ අසුන් ගෙන සිටි අතර, තවත් මන්ත්‍රීවරුන් 120 දෙනෙකුට පමණ Zoom තාක්ෂණය ඔස්සේ පාර්ලිමේන්තු රැස්වීමට සම්බන්ධ වීමට අවස්ථාව ලැබී ඇත.

ලොව පුරා පවත්නා කෝවිඩ්-19 වසංගත තත්ත්වය හමුවේ වුවද නියෝජිත ප්‍රජාතන්ත්‍රවාදයේ සුරක්ෂිතභාවය අරමුණු කරගනිමින් බ්‍රිතාන්‍ය පාර්ලිමේන්තුවේ වසර 700 ක ඉතිහාසයේ ප්‍රථම වතාවට පාර්ලිමේන්තු අධිකාරීත්වයේ ඒකග්‍රතාවය ඇතිව **Zoom** තාක්ෂණය ඔස්සේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට ඇමතිවරුන්ගෙන් ප්‍රශ්න කිරීමේ අවස්ථාව උදා වී තිබේ.

බ්‍රිතාන්‍ය පාර්ලිමේන්තුවේ කථානායකවරයා, සභානායකවරයා, විපක්ෂ නායකවරයා සහ එස්.එන්.පී (ස්කොට්ලන්ත ජාතික පක්ෂය) ප්‍රකාශකවරයා ඇතුළු පිරිසක් සභා ගර්භයේ අසුන්ගෙන සිටින අතර, අනෙකුත් මන්ත්‍රීවරුන්ට Zoom තාක්ෂණය ඔස්සේ සම්බන්ධ වීමට ප්‍රායෝගිකව අවකාශය ලැබීම නිසා පාර්ලිමේන්තු රැස්වීම් 'දෙමුහුන්' ආකෘතියක් උසුලනු දක්නට ලැබිණි.

ඉහත සඳහන් 'දෙමුහුන්' ආකෘතිය වර්තමානයේ පවතින තාක්ෂණික ධාරිතාව තුළ ඉතාමත් කඩිනමින් සකසා ගත්තක් වූ නමුත් එය අනාගතයේදී ඩිජිටල් තාක්ෂණයෙන් සපිරි පාර්ලිමේන්තුවක් කරා ළඟා විය හැකි ක්‍රියාවලියක් සපුරාගැනීමේ ඵලදායි පළමු පියවර ලෙස සාර්ථක වී ඇතැයි බ්‍රිතාන්‍ය පාර්ලිමේන්තුව පවසයි.

කෝවිඩ්-19 වසංගත තත්ත්වය හමුවේ මන්ත්‍රීවරුන් 50 දෙනෙකු පමණ දැඩි සමාජ දුරස්ථ නීතිරීති යටතේ සභා ගර්භයේ අසුන් ගෙන සිටි අතර, තවත් මන්ත්‍රීවරුන් 120 දෙනෙකුට පමණ Zoom තාක්ෂණය ඔස්සේ පාර්ලිමේන්තු රැස්වීමට සම්බන්ධ වීමට අවස්ථාව ලැබී ඇත. මෙහිදී සභා ගර්භයේ සිටින ඕනෑම මන්ත්‍රීවරයකු හා සමාන ලෙස Zoom තාක්ෂණය ඔස්සේ සම්බන්ධ වන මන්ත්‍රීවරයාද සලකනු ලබන අතර, න්‍යාය පත්‍රයට අනුව කථිකයන්ට සමාන අවස්ථාව ලැබේ.

සභා වාර ක්‍රියාත්මක වන්නේ කෙසේද සභා ගර්භයේ සිටින කථානායකවරයාට සහ පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට Zoom තාක්ෂණය ඔස්සේ සම්බන්ධ වන මන්ත්‍රීවරුන් දැකබලා ගැනීමට ඉඩ සලසමින් සභා ගර්භය වටා ප්‍රදර්ශන තිර ගණනාවක් රඳවා තිබේ. Zoom තාක්ෂණය ඔස්සේ සභාව අමතන මන්ත්‍රීවරයෙකු "කිසියම් තාක්ෂණික දෝෂයක් මත ශ්‍රවණය කිරීමට හෝ දැකීමට නොහැකි වන විටකදී", එම රැස්වීමේම පසුව එළැඹෙන වෙලාවකදී සභාව ඇමතීමට ඔවුන්ට අවසර ඇත. දෙමුහුන් ක්‍රියාමාර්ග සිදු වෙමින් පවතින විටදී මැදිහත්වීම් සඳහා අවස්ථාවක් නොලැබෙන අතර රීති ප්‍රශ්න මතු කිරීමට අවකාශ නැත.

විශේෂාංග

# පාර්ලිමේන්තුවේ බලාධිකාරයේ සහ ප්‍රෞඪත්වයේ සංකේතය සෙංකෝලය



**සෙංකෝලය, බොහෝ පොදු රාජ්‍ය මණ්ඩලයීය රටවල පාර්ලිමේන්තුවේ බලය විදහා පාන්නාවුත්, පාර්ලිමේන්තුව තුළ කතානායකවරයාගේ බලය සංකේතවත් කරන්නාවූත් භෞතික සංකේතයයි. ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ සම්ප්‍රදාය අනුව ද යම් පාර්ලිමේන්තු රැස්වීමක් වලංගු වීම සඳහා අදාළ අවස්ථාවේදී සෙංකෝලය පාර්ලිමේන්තුවේ තිබීම අත්‍යවශ්‍ය වේ.**

අතීතයේ බ්‍රිතාන්‍ය රජතුමා ඉදිරියෙන් පෞද්ගලික ආරක්ෂකයෙකු රාජ යෂ්ටියක් ගෙන ගමන්කර තිබේ. පසු කලෙක රජු වෙනුවට පාර්ලිමේන්තු සභාවාර සඳහා රජුගේ නියෝජිතයෙකු මුලසුන ගත් අතර ඔහු කථානායක නමින් හැඳින්විණි. මේ අනුව, එතෙක් රජතුමා ඉදිරියෙන් ගමන්ගත් පුද්ගලික ආරක්ෂකයා වේත්‍රධාරී ලෙසද රාජ යෂ්ටිය සෙංකෝලය ලෙසද කථානායකතුමා වෙත භාර කෙරිණි. එහිදී සෙංකෝලය රජුගේ පරමාධිපත්‍ය බලයේ සංකේතය වශයෙන් පිළිගැනිණි.

සෙංකෝලය උරහිසින් දරාගත් වේත්‍රධාරි පෙරටුකොටගත් කථානායකතුමා පාර්ලිමේන්තු ලේකම්වරුන් සමඟ පෙරහරින් සභා ගර්භයට පිවිස, සෙංකෝලය තැන්පත් කිරීම සඳහා ඇති ආධාරකය මත වේත්‍රධාරි විසින් සෙංකෝලය තැන්පත් කිරීමෙන් පසු අසුන් ගැනීමත් සමඟ පාර්ලිමේන්තුවේ වැඩකටයුතු ඇරඹේ.

ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ සෙංකෝලය අතීත හෙළ සම්ප්‍රදාය සිහිගන්වන විශිෂ්ට කලාත්මක නිර්මාණයක් ලෙස ද හැඳින්විය හැකිය. මෙය මහා බ්‍රිතාන්‍යයේ මහජන මන්ත්‍රී මණ්ඩලය විසින් 1949 දී ලංකාවේ නියෝජිත මන්ත්‍රී මණ්ඩලය වෙත ප්‍රදානය කරන ලද්දකි. ලාංකේය සංස්කෘතික අනන්‍යතාව සුරකිමින් හෙළ කලා සම්ප්‍රදායට අනුව රජයේ ලලිත කලායතනයේ ආචාර්යවරයකු වූ එ.ස්.පී. චාර්ල්ස් මහතා මෙහි සැලැස්ම නිර්මාණය කිරීමෙන් අනතුරුව එදා බකිංහැම් මාළිගයට ස්වර්ණාභරණ නිර්මාණය කළ “ජෙරාඩ්” නම් එංගලන්ත සමාගමේ ඩැනියෙල් ස්පෙන්සර් නම් කාර්මිකයා විසින් “සෙංකෝලය” නිර්මාණය කර ඇත.

එසේ නිමවූ සෙංකෝලයේ බර රාත්තල් 28 ක් හෙවත් කි.ග්‍රෑ. 12.5 ක් වන අතර එය දිගින් අඟල් 48 ක් වේ. සෙංකෝලය නිමැවුමෙහි සංකල්පීය අර්ථය පෙරදිග සෞන්දර්යයේ සංකේතය වන නෙළුම් මල මූලික කර ගත්තකි.රිදියෙන්, කැරට් 18 රනින් හා නීල මාණික්‍යයෙන් සරසා ඇති කළුවර දැවමය යෂ්ටිය අඟල් 28කි.

අගනා රන්, රිදී, පළිඟු සහ දැව යොදාගනිමින්, හෙළ සම්ප්‍රදායට ආවේණික සියුම් කැටයමින් සමලංකෘතව, ලාලිත්‍යයෙන් යුතුව නිර්මිත ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ සෙංකෝලය අතීත ශ්‍රී විභූතිය සිහිගන්වන මනෝරමණීය කලාත්මක නිමැවුමකි.

# පාර්ලිමේන්තු පනතක් සම්මත කිරීමේ ක්‍රමවේදය



ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 75 වන ව්‍යවස්ථාව යටතේ නීති පැනවීමේ මූලික ව්‍යවස්ථාදායක බලය පාර්ලිමේන්තුවට ලැබී තිබේ. අතීතයටද බල පැවැත්වෙන නීති සෑදීමේ බලය ඇතුළු නීති සම්පාදනය කිරීමේ සහ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ කවර වූ හෝ විධි විධානයක් අහෝසි කිරීමේ, සංශෝධනය කිරීමේ හෝ එකතු කිරීමේ බලයද ඊට අයත් වේ. සියලු ව්‍යවස්ථාදායක යෝජනා,කෙටුම්පත් ආකාරයෙන් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ යුතුය. ආණ්ඩුවේ පනත් කෙටුම්පත්, පෞද්ගලික මන්ත්‍රීවරුන්ගේ පනත් කෙටුම්පත් වැනි විවිධ වර්ගවල පනත් කෙටුම්පත් සම්මත කිරීමේ විවිධ ක්‍රියාපටිපාටි ද තිබේ.

අමාත්‍ය මණ්ඩලයේ සාමාජිකයෙකුට ආණ්ඩුවේ පනත් කෙටුම්පත් ඉදිරිපත් කළ හැකිය. අදාළ අමාත්‍යාංශ මඟින් සකසන මූලික පනත් කෙටුම්පත නිල කෙටුම්පතක් ලෙස සකසා ගැනීම සඳහා නීති කෙටුම්පත් සම්පාදකවරයාට යොමු කරයි. අනතුරුව පනත් කෙටුම්පතේ ව්‍යවස්ථානුකූලභාවය පරීක්ෂා කිරීම සඳහා නීතිපතිවරයාටද යොමු කෙරේ. ඒ සඳහා ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවේ 77 වන ව්‍යවස්ථාව මඟින් බලය හිමිවේ.

අනතුරුව නීතිපතිවරයාගේ සහතිකය සමඟ පනත් කෙටුම්පත අමාත්‍ය මණ්ඩලය වෙත යොමු කරයි. පනත් කෙටුම්පත ගැසට් පත්‍රයේ පළ කිරීමට සහ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමට අමාත්‍ය මණ්ඩල අනුමැතිය අවශ්‍ය වේ. පනත් කෙටුම්පත එලෙස පාර්ලිමේන්තුවට පිළිගැන්වීම පළමුවර කියවීම ලෙස සැලකේ. ඉදිරිපත් කළ පනත් කෙටුම්පතක් දෙවන වර කියවීම, ප්‍රධාන විවාදය වන අතර, එහිදී මන්ත්‍රීවරු එම විෂය පිළිබඳව අදහස් පළ කරති. එහි දී පනත් කෙටුම්පතේ මූලධර්ම හා විෂය පථය සම්බන්ධව පුළුල් කරුණු සාකච්ජා කෙරේ. දෙවැනි වර කියවීමේ ජන්ද විමසීමෙන් අනතුරුව පනත් කෙටුම්පතක් පූර්ණ පාර්ලිමේන්තු කාරක සභාවකට යොමු කළ යුතු අතර, ව්‍යවස්ථාදායක ස්ථාවර කාරක සභාවකට හෝ විශේෂ කාරක සභාවකට ද යොමු කළ හැකිය.

කෙසේ වෙතත්, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 121 වැනි ව්‍යවස්ථාව ප්‍රකාරව යම් පුරවැසියෙකු විසින්, පනත් කෙටුම්පතක් අධිකරණය තුළදී අභියෝගයට ලක්කර ඇති අවස්ථාකදී, අධිකරණයේ තීරණය දෙන තෙක් හෝ ඒ යොමු කිරීමේ නැතහොත් පෙත්සමේ දින සිට සති 03 ක කාල සීමාවක් ඉකුත් වන තෙක් හෝ යන මෙයින් පළමුවෙන් එළඹෙන දිනය තෙක්, ඒ පනත් කෙටුම්පත සම්බන්ධයෙන් පාර්ලිමේන්තුවේදී කිසිදු පියවරක් නොගත යුතුය.

තුන්වන වර කියවීමේදී කාරක සභා අවස්ථාවේ කරන ලද, යම් සංශෝධනයක් ද සහිතව කෙටුම්පත සමස්තයක් වශයෙන් සම්මත කරයි. එලෙස සම්මත කරගත් පනත් කෙටුම්පතක් නීතියක් බවට පත්වීමට නම් කථානායකවරයාගේ සහතිකය එතුමාගේ අත්සන සහිතව සටහන් කළ යුතුය. ඒ සඳහා ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවේ 80 වන ව්‍යවස්ථාව මඟින් බලය හිමිවේ.

# කෝවිඩ් 19 වසංගතය පාර්ලිමේන්තු පරිශ්‍රයේ පැතිරීම වැළැක්වීමට පියවර





කෝවිඩ් 19 වසංගත රෝගය පාර්ලිමේන්තු පරිශ්‍රය තුළ පැතිරීම වළක්වා ගැනීම සඳහා අවශ්‍ය වන සියලු සෞඛ්‍යාරක්ෂණ ක්‍රියාමාර්ග මේ වන විට පාර්ලිමේන්තු පරිශ්‍රය තුළ ක්‍රියාත්මක කොට ඇති බව පාර්ලිමේන්තුවේ නියෝජ්‍ය මහ ලේකම් හා කාර්ය මණ්ඩල ප්‍රධානි නීල් ඉද්දවල මහතා පැවසීය. ඒ පිළිබඳ පාර්ලිමේන්තු මහලේකම් කාර්යාලය විසින් කාර්ය මණ්ඩලය දැනුවත් කිරීමද සිදු කෙරිණ. ඉදිරි සති කිහිපය ඇතුළත පාර්ලිමේන්තුවේ කටයුතු සම්පූර්ණයෙන් යථා තත්ත්වයට පත් කිරීම මෙම වැඩපිළිවලේ අරමුණයි.

රට පුරා ව්‍යාප්ත වූ කෝවිඩ් 19 වසංගත තත්ත්වය හේතුවෙන් හදිසි හා අත්‍යවශ්‍ය කටයුතුවලට පමණක් සීමා කර තිබූ ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ මහලේකම් කාර්යාලයේ කටයුතු පසුගිය මැයි මස 11 වැනිදා නැවත ආරම්භ කෙරිණ. ඒ අනුව පාර්ලිමේන්තුවේ මහලේකම් ධම්මික දසනායක මහතා ඇතුළු දෙපාර්තමේන්තු ප්‍රධානීන් සේවයට වාර්තා කළ අතර, එදින පැවති රැස්වීමේදී අදාළ දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් සකසන ලද රාජකාරි දින පැවරුම් ලැයිස්තුවකට අනුව අනෙකුත් සේවකයන් සේවයට වාර්තා කිරීමට තීරණය විය.




කෙසේ නමුත් අවසර ලත් පාර්ලිමේන්තු කාර්ය මණ්ඩලය හැර වෙනත් කිසිවෙකුට පාර්ලිමේන්තු පරිශ්‍රයට ඇතුළුවීමට අවසර ලබා දෙනු නොලැබේ.




# කොවිඩ්-19 වෛරසයෙන් ඔබව ආරක්ෂා කරගැනීම සඳහා ගත යුතු පියවර

- දෑත් මනාව පිරිසිදු කරගැනීම
- ශරීර උෂ්ණත්වය පරීක්ෂා කිරීම
- පාවහන් විෂබීජානුහරණය කිරීම
- කාර්යාලය තුළ රැඳෙන සැමවිටම මුඛ ආවරණය පැළඳ සිටින්න
- සැහැල්ලු සුදුසු ඇඳුමකින් සැරසී සේවයට වාර්තා කිරීම සහ අතිරේක පළඳනා ආදිය භාවිතයෙන් හැකිතාක් දුරට වැළැකීම
- හැකි සෑම විටම තමන් පරිහරණය කරනු ලබන පෑන්, ලිපිද්‍රව්‍ය, පරිගණක, දුරකථන ආදිය පිරිසිදු කර තබන්න
- අත්‍යවශ්‍ය දෑ හැර වෙනත් උපකරණ, මෙවලම් යනාදිය රැගෙන ඒමෙන් වළකින්න. විශාල ප්‍රමාණයේ/පිටේ එල්ලාගෙන යනු ලබන ගමන්මලු (Back pack) රැගෙන ඒම සම්පූර්ණයෙන් තහනම් වේ.
- රාජකාරී ඇරඹීමට පෙර ඔබ පරිහරණය කරන පරිගණක, මේසය හා පෑන් ආදිය විෂබීජහරණය කරන්න
- කාර්යාලයේ අංශ අතර ගමන් කිරීමෙන් වළකින්න
- ඔබට උණ හෙම්බිරිස්සාව, කැස්ස ඇත්නම් ආයතන ප්‍රධානියා දැනුවත් කර නිවසේ රැඳී සිටින්න
- සෝපානය ගමන් කිරීමේදී එකිනෙකාට ප්‍රතිවිරුද්ධ දිශාවන්ට හැරී ගමන් කරන්න



# ඔබ හැන්සාඩ් වාර්තාව ගැන දැනුවත් ද ?




පාර්ලිමේන්තුවේ රැස්වීම්වලට අදාළ දෛනික නිල වාර්තාව වන හැන්සාඩ් වාර්තාව 'පාර්ලිමේන්තුවේ සත්‍ය කැඩපත'(True mirror of Parliament) සහ ඉතිහාසයේ ශ්‍රවණේන්ද්‍රිය (Auditory of History) යන විරුදාවලින්ගෙන් පිදුම් ලබන්නාක් මෙන්ම එය සභාවේ ජීවයයි. ඉතා අවධානයෙන් පරිශීලනය කරන කෙනෙකුට සැබවින්ම එය බරසාර දැනුම් මල්ලකි.

17 වන ශතවර්ෂය තෙක් දිවෙන ඉතිහාසයකට උරුමකම් කියන හැන්සාඩ් වාර්තාව ලංකාවේ උපත ලබන්නේ 1870 වර්ෂයේ බ්‍රිතාන්‍ය කිරීටය යටතේ ව්‍යවස්ථාදායකය සහ විධායක යන උභය මණ්ඩලවලින් මේ රට පාලනය කරන සමයේදී ය. අද්‍යතන ශ්‍රී ලංකාවේ හැන්සාඩ් වාර්තාවේ ගුණාත්මකභාවය ලොව අනෙකුත් සංවර්ධිත රටවල හැන්සාඩ් වාර්තාවන්හි ගුණාත්මකභාවයට සමාන තත්ත්වයකම රඳවා පවත්වා ගැනීමට ද සමත්ව ඇති බව පෙනේ. 1883 වර්ෂයේ Ceylon Hansard වාර්තාවල සිට හැන්සාඩ් වාර්තා සුරක්ෂිතව පාර්ලිමේන්තු පුස්තකාලයේ තබා ඇත්තේ අවශ්‍ය පාර්ශවයනට පරිශීලනයට පහසුකම් ද සපයමිනි.

"හැන්සාඩ්" යන නාමය මෙම නිල වාර්තාවට ලැබී ඇත්තේ බ්‍රිතාන්‍ය පාර්ලිමේන්තුවේ ලිපිලේඛන මුද්‍රණය කිරීමේ කටයුතු භාරව සිටි ලූක් හැන්සාඩ්, ඔහුගේ පුත්‍රයා වූ තෝමස් කර්සන් හැන්සාඩ් (Thomas Curson Hansard, 1776-1833) සහ දරු මුනුපුරන්ගේ පෙළපත් නාමයෙනි.

මුල් කාලයේ ඉංග්‍රීසි භාෂාවෙන් පමණක් හැන්සාඩ් වාර්තාව පළ වූයේ එදා සභාවේ සිටි කථිකයන් තම අදහස් පළ කළේ ඉංග්‍රීසි භාෂාවෙන් පමණක් වූ හෙයිනි. නමුත් විසි වන ශතවර්ෂයේ මැද භාගයේ සිට සිංහල හා දෙමළ භාෂාවෙන්ද කථිකයන් අදහස් පළ කළ හෙයින් එලෙස කථා කරන භාෂාවෙන්ම එම කථා හැන්සාඩ් වාර්තාවට ඇතුළත් වීමට පටන් ගති.

**හැන්සාඩ් වාර්තාව වැදගත් වන්නේ ඇයි?**

■ ප්‍රජාතන්ත්‍රවාදය තුළ, ඔබ ඡන්දය දුන් සහ ඔබ නියෝජනය කරන පුද්ගලයින් පවසන දේ වෙත ප්‍රවේශ වීම වැදගත් අංගයකි. සභා රැස්වීම් පැවැති දිනයන්හි සභාවේදී සිදුවුණු කරුණු එපරිද්දෙන්ම දැන ගැනීමට හැකි ලෙසට කථිකයන්ගේ භාෂා ශෛලිය හා උච්චාරණය පවා ආරක්ෂා වෙන පරිදි

ශෛලිය හා උච්චාරණය පවා ආරක්ෂා වෙන පරිදි වාර්තාව සකසමින් හැන්සාඩ් වාර්තාව ඉටු කරන්නේ එම වගකීමයි. ශ්‍රී ලංකාවේ ප්‍රජාතන්ත්‍රවාදය වෙත සෑම කෙනෙකුටම ප්‍රවේශ විය හැකි සහ විනිවිද පෙනෙන බව එයින් සහතික කරයි.

■ පාර්ලිමේන්තු විවාදවල ඓතිහාසික වාර්තා සම්බන්ධයෙන් කරුණු දැන ගැනීමට

■ ඒ ඒ කාලවකවානුවලට අදාළ සමාජයීය,දේශපාලනමය, ආගමික, සංස්කෘතිකමය සහ ආර්ථිකමය කරුණු සම්බන්ධයෙන් විස්තර ලබා ගැනීමට

(පෙත්සම්, වාචික පිළිතුරු අපේක්ෂිත ප්‍රශ්න සහ පිළිතුරු, ලිඛිත පිළිතුරු අපේක්ෂිත ප්‍රශ්න සහ පිළිතුරු, අගමැතිතුමාගෙන් අසන ලද ප්‍රශ්න සහ පිළිතුරු, අමාත්‍යාංශ නිවේදන, පෞද්ගලික පැහැදිලි කිරීම්, වරප්‍රසාද ප්‍රශ්න, සභාව කල් තබන අවස්ථාවේ අසන ලද ප්‍රශ්න යනාදී මේ සියල්ලෙන්ම අසන්නේ ඒ ඒ කාල වකවානුවලට අදාළ සමාජ ප්‍රශ්න වන බැවින් එම කාල සීමාවේ ලාංකික සමාජය ගැන දැනුමක් ලබා ගැනීමට මෙමඟින් හැකියාව ලැබෙනු ඇත).

■ වෙනත් මන්ත්‍රීවරයෙක් සභාවේ කලින් සඳහන් කළ කරුණක් ගැන අවධානය යොමු කරවීමට (හැන්සාඩ් වාර්තාවේ දිනය සහ තීරු අංකය සඳහන් කරමින් අදාළ උපුටා දැක්වීම් කරයි. බොහෝ විට වාදවිවාදවලදී මෙසේ ඉදිරිපත් කිරීම් කරනු දක්නට ලැබේ).

■ ඒ ඒ පාර්ලිමේන්තුවලට අදාළ පාර්ලිමේන්තු නියෝජිතයන් පිළිබඳ විස්තර දැන ගැනීමට

■ එක් එක් පාර්ලිමේන්තුවට අදාළ අමාත්‍ය ධුර (portfolio) දැන ගැනීමට (සෑම කලාපයකම පළමුවන වෙළුමේ මෙම විස්තර ඇතුළත් වෙයි).

■ එක් එක් පාර්ලිමේන්තු නියෝජිතයන්ගේ දේශපාලන මත පිළිබඳ කරුණු දැන ගැනීමට

■ මන්ත්‍රීවරුන්ගේ කථා පරිශීලනයට

■ නීතිමය කරුණු සම්බන්ධයෙන් මූලික දත්ත මූලාශ්‍රයක් ලෙසට, (අධිකරණයක නඩු කටයුත්තක් ඔප්පු කිරීමට යාමේදී, හැන්සාඩ් වාර්තාවකට යුක්තිය සහ සාධාරණය වෙනුවෙන් ඉටු කළ හැකි මහත් වූ කාර්යභාරය Pepper vs Hart (1993) AC 593 නඩුකරයෙන් පෙන්වා දී ඇත. ඒ අනුව ප්‍රාථමික නීති සම්පාදනය අපැහැදිලි නම් හෝ බහු අරුත් දෙන්නේ නම් එම නීති සම්පාදනය කිරීමේදී අමාත්‍යවරුන් හෝ වෙනත් පනත් කෙටුම්පතක් ප්‍රවර්ධනය කරන්නන් විසින් පාර්ලිමේන්තුවේ කරන ලද ප්‍රකාශයන් අධිකරණය විසින් යම් යම් තත්ත්වයන් යටතේ සැලකිල්ලට ගත හැකිය. එහිදී පනත් කෙටුම්පත ඉදිරිපත් කිරීමේදී අමාත්‍යවරයාගේ අරමුණ කුමක්ද යන්න ගැන සලකා බලයි. ඒ අනුව 1993 වර්ෂයේ සිට නඩු ඔප්පු කිරීමේ සාධකයක් වශයෙන්ද හැන්සාඩ් වාර්තාව භාවිතයට ගැනෙන බව පෙනේ).

■ ශ්‍රී ලංකාවේ රාජ්‍ය භාෂා වන සිංහල සහ දෙමළ මාධ්‍යයෙන් මෙන්ම සන්ධාන භාෂාව වන ඉංග්‍රීසි භාෂාවෙන්ද මන්ත්‍රීවරුන් කථා කරන බැවින් හා අදාළ වැදගත් ලේඛන එම භාෂාත්‍රයෙන්ම පළවන හෙයින් එම භාෂා ඉගෙනුම් මෙවලමක් ලෙසට, (20 වන සියවසේ මැද භාගයේදී පමණ වැඩි වශයෙන් ඉංග්‍රීසි භාෂාවෙන් සභාවේ වැඩ කටයුතු සිදුව ඇති හෙයින් එකල හැන්සාඩ් වාර්තාව එදා සිටි සමාජයේ බොහෝ දෙනෙක් ඉංග්‍රීසි භාෂාව ඉගෙනීම සඳහා භාවිත කර ඇති බව පෙනේ).

■ භාෂා පරිවර්තක සහ භාෂණ පරිවර්තක රැකියාවන්ට ළැදි පාර්ශ්වයනට තම හැකියා වර්ධනය කර ගැනීමට ඉගෙනුම් මෙවලමක් ලෙස

■ ලඝු ලේඛකයන්ට, හැන්සාඩ් වාර්තාකරුවන්ට මෙන්ම එම රැකියා සම්බන්ධව නිපුණතාවක් ලබා ගැනීමට ළැදි පාර්ශ්වයනට ඉගෙනුම් මෙවලමක් ලෙස, (තම ලඝුලේඛන වේගය තීව්‍ර කර ගැනීමට මෙන්ම පාර්ලිමේන්තු භාෂාව ගැන දැනුමක් ලබා ගැනීමට).

හැන්සාඩ් වාර්තාවේ ඇත්තේ එදිනෙදා සිදු වූ කරුණු පදානුසාරයෙන් වූ වාර්තාකරණයකි. සභාවේ මන්ත්‍රීවරුන් කථා කරන භාෂාවෙන්ම, හැන්සාඩ් වාර්තාකරුවන් විසින් ලඝු සටහන ආශ්‍රිතයෙන් වාර්තා කරනු ලබන එම කථා ඒ ඒ භාෂාවෙන් පරිගණකගත කොට කථිකයාගේ කථා ශෛලිය හා උච්චාරණය ද හැකිතාක් දුරට ආරක්ෂා කරමින්, පාර්ලිමේන්තුවට නුසුදුසු වචන ස්ථාවර නියෝගවලට අනුව මූලාසනයේ අණ පරිදි ඉවත් කරමින්, සහකාර හැන්සාඩ් සංස්කාරකවරුන්, නියෝජ්‍ය හැන්සාඩ් සංස්කාරකවරුන්ගේ සහ හැන්සාඩ් සංස්කාරකගේ සංස්කරණයට ලක්වීමෙන් පසුව සභාව පැවැත් වූ එක් එක් දිනට අදාළව මුද්‍රණය වන හැන්සාඩ් වාර්තාව https://www.parliament.lk/si/business-of-parliament/hansard යටතේ කියවා බැලීමට හා බාගත කර ගැනීමට පහසුකම ද අද්‍යතනයේ සලසා ඇත.



**ගුණවතී පිටවල**
**සහකාර හැන්සාඩ් සංස්කාරක**

# ශ්‍රී ලංකාවේ 70 වසරක කාන්තා දේශපාලනය

**ස්ත්‍රී පුරුෂභාවය කිසියම් වෘත්තියක නියුක්තවීමට හෝ එහි හිණි පෙත්තට නැගීමට බාධාවක් නොවෙතැයි සියලු ශිෂ්ට සම්පන්න සමාජයන් විශ්වාස කරතත්, ලොව පුරා වෙසෙන බහුතර කාන්තාවන් දේශපාලනයට පිවිසීමේදී මුහුණ දෙන්නේ ඊට වඩා වෙනස්, එක සමාන කටුක අත්දැකීමකටය.**

ශ්‍රී ලංකාවේද දේශපාලනයේ නිරත කාන්තාවන් වැඩි දෙනා මේ දුෂ්කරතාව මැනවින් හඳුනන්නියෝය. එහෙයින්, වයස 21 කට නොවැඩි කාන්තාවන්ට ඡන්ද බලය හිමිවූ ප්‍රථම දකුණු ආසියාතික රට ලෙස 1931දී නම් ලැබ, ලොව පළමු අගමැතිනිය බිහි කළද වර්තමාන දේශපාලනයෙහි කාන්තා නියෝජනය සම්බන්ධයෙන් නම් ශ්‍රී ලංකාව සිටින්නේ දකුණු ආසියාතික රටවල් රැසකට පසුගාමීවය.

මෙය අප්‍රිකානු ආසියාතික - බොහෝ දෙනා වහරන්නාක් මෙන් තෙවෙනි ලෝකයේ රටවලට පමණක් සීමාවූ තත්ත්වයක් නොවන බවද සඳහන් කළ යුතුය. ලොව පවතින සියලු පාර්ලිමේන්තුවල මන්ත්‍රී සභිකයන්ගේ සංඛ්‍යාව 46,064 ක් වන අතර ඉන් කාන්තා මන්ත්‍රීවරියන් සිටින්නේ 10,849 කි. එනම්, ලොව බහුතර මහජනයා නියෝජනය කරන්නේ 35,215ක් වන පුරුෂ මන්ත්‍රීවරුන් විසිනි. එමඟින් ලෝකයේ බල සමතුලිතතාව ගිලිහී ඇතිවාක් මෙන්ම කාන්තා සමානත්මතාවයටද හානි වෙයි.

එනමුත්,දේශපාලනයේ කාන්තා නියෝජනය ඉහළ ප්‍රතිශතයක් ගන්නා සමහර රටවල් සංවර්ධිත යුරෝපීය හෝ නෝර්ඩික් රටවල් බව ඇත්තකි. මෑත කාලීන කොවිඩ් -19 වසංගත තත්ත්වය හමුවේ මේ රටවල් බොහොමයක නායිකාවන් කටයුතු කළ ආකාරය ප්‍රශංසාවට පාත්‍ර වූ බවද අමතක කළ නොහේ. සංවර්ධනය වෙමින් පවතින රටවල් - උප සහරා අප්‍රිකානු රටවල ජාතික මට්ටමේ කාන්තා දේශපාලන නියෝජනය 30% දක්වා ඉහළ අගයක් කරා ගෙන එන්නට ඔවුන් සමත්ව ඇත්තේ ඊට අදාළ වූ ව්‍යවස්ථාපිත මූලෝපායන්ගේ පිහිටෙනි.



උගන්ඩාවේ පාර්ලිමේන්තුවල සභිකයන්ගේ සංඛ්‍යාව 80 ක් වන අතර ඉන් 64%ක ප්‍රතිශතයක් එසේත් නැතිනම් මන්ත්‍රීවරියන් 51 දෙනෙක් සභිකයන් ලෙස පත්ව සිටීම උදාහරණයක් ලෙස දැක්විය හැකිය.

උගන්ඩාව මේ තත්ත්වය උදා කරගෙන ඇත්තේ, ව්‍යවස්ථාපිත පංගු ක්‍රමය - අපට පුරුදු වචනයෙන් නම් 'කෝටාව' උපයෝගි කරගෙනය. එරටේ ජාතික, පළාත් හා ප්‍රාදේශීය දේශපාලනයෙහි 60% ක කෝටාවක් නැත්නම් පංගුවක් අනිවාර්යයෙන් කාන්තාවන්ට හිමිය.මේ ක්‍රමය උපයුක්ත කරගනිමින් 90 දශකයේ අගභාගයේ සිට 2000 මුල දක්වා අප්‍රිකානු රටවල් ස්වකීය කාන්තාවන් ට දේශපාලනයේ සම අවස්ථා ලබා දීමට පුරෝගාමී වී තිබේ.

අපේ රටේ කාන්තාවන් දේශපාලනයට පිවිසීමේදී මුහුණ දෙන බාධා මොනවාද යන්න, නිතර සමාජයෙන් නැගෙන ප්‍රශ්නයක් වන අතර සෑම දකුණු ආසියාතික රටක මෙන්ම ලංකාවේද කාන්තාවන් දේශපාලනයට යොමුවීමේදී ඔවුන්ගේ පවුල් පසුබිම තීරණාත්මක සාධකයක් බව නිරීක්ෂිතය. එවන් දේශපාලන පවුලකින් නොපැමිණෙන සාමාන්‍ය පවුලක කාන්තාවක සතු දේශපාලන අධිෂ්ඨානය කෙතරම් දැඩි වුවද සමාජ බලපෑම්, මූල්‍ය ශක්තියෙහි හිඟය වැනි සාධක ඇගේ ගමන මන්දගාමී කරවයි.

මෙම වෙනස ඇරඹුණේ 1910, 1920, 1924 දී ලංකා ව්‍යවස්ථාදායක සභාවට තේරී පත් වීමට කාන්තාවන් නුසුදුසු බවට වූ සඳහනෙනි. 1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12(2) වගන්තියට අනුව නම්, වර්ගය, ආගම, භාෂාව, කුලය, දේශපාලන මතවාදය, උපන් ස්ථානය මෙන්ම ස්ත්‍රී පුරුෂ භේදය මතද පුද්ගලයකු වෙනස් කොට හෝ විශේෂ කොට නොසැලකිය යුත්තේය. එම ව්‍යවස්ථාවෙහිම 26(7) අනුව කාන්තාවන්ට සම ඉඩ ප්‍රස්තා ලැබිය යුතු බව සඳහන් වේ.

ශ්‍රී ලංකාවේ ව්‍යවස්ථාවේ මෙම ප්‍රතිපාදන කාන්තාවක දේශපාලනය ට පිවිසීමේදී මුහුණ දෙන නීතිමය-ලිඛිත බාධා සුන් කර දමයි. එනමුත්, පසුගිය අටවැනි පාර්ලිමේන්තුව නියෝජන කළ කාන්තා මන්ත්‍රීවරියන් සංඛ්‍යාව 12ක් විය. ප්‍රතිශතයක් අනුව මෙය 6% කට අඩුය. එනිසාම, අන්තර් පාර්ලිමේන්තු සංසදයෙහි කාන්තා දේශපාලන නියෝජන ශ්‍රේණිගත කිරීම් අනුව අපට ලැබී ඇත්තේ රටවල් 138 කින් 128වෙනි ස්ථානයය. එය නිහඬව කියා පාන්නේ, කාන්තා ජනගහනය 51% ක් වන ශ්‍රී ලංකාවේ කාන්තා දේශපාලන නියෝජනය කිසිසේත්ම සතුටුදායක මට්ටමක නොපවතින බවයි.

බොහෝ දුරට අපට සමාන සමාජයීය, සංස්කෘතික සහ ආගමික ලක්ෂණ සහිත අසල්වැසි දකුණු ආසියාතික රටවල් සිය කාන්තා නියෝජනය වැඩි කරගැනීමට ව්‍යවස්ථා ප්‍රතිපාදනයක් ලෙස "පංගු ක්‍රමය" යහ පුරුද්දක් සේ සාර්ථකව යොදාගත් රටවල් බව කිව හැකිය. යම් යම් සංස්කෘතික තහංචි වෙතැයි අප සලකන ඇතැම් රටවලද දේශපාලනයේ කාන්තා නියෝජනය ඇත්තේ අපට වඩා තෙගුණයක්ටත් එහායිනි. එනමුත්, ඒවා එක රැයින් සැබෑ වූ සිහින නොවේ. උදාහරණයකට අසල්වැසි ඉන්දියාවේ මන්ත්‍රීවරුන් 2/3ක් කාන්තාවන්ට වෙන්කර තැබීම සදහා වූ පනත 1996 පටන් අද දක්වාම සම්මත කර ගැනීමට ඉඩ ලැබී නැත. 2010 රාජ්‍ය සභාවෙහි කාන්තා නියෝජනය 33% ක් විය. 2/3 ක් කාන්තාවන් පත් කෙරෙන කෝටාව රාජ්‍ය සභාවේදී සම්මත නොවුණද ෂිලාපර්ෂද් හා පන්චායත් මට්ටමේ අනුමතව දැන් ක්‍රියාත්මකව පවතී.

**මූලාශ්‍රය - පාර්ලිමේන්තු පර්යේෂණ අංශය**

ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ වර්තමාන මහ ලේකම් ධුරය හොබවන ධම්මික දසනායක මහතා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ වැඩබලන මහ ලේකම්වරයා ද වෙයි.

කොළඹ ඩී. එස්. සේනානායක විද්‍යාලයෙන් සහ රාජකීය විද්‍යාලයෙන් අධ්‍යාපනය ලබා ඇති ධම්මික දසනායක මහතා සිය එල්.එල්.බී (නීතිවේදී) සහ එල්.එල්.එම් (නීතිපති) උපාධි සම්පූර්ණ කළේ කොළඹ විශ්වවිද්‍යාලයෙනි. ශ්‍රී ලංකාවේ ශ්‍රේෂ්ඨාධිකරණයේ නීතිඥයෙක් වශයෙන් දිවුරුම් දීමෙන් අනතුරුව, 1988 දී එතුමා ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ නීති උපදේශක (පර්යේෂණ) ලෙස පත් විය.



ධම්මික දසනායක
ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ
මහලේකම්
ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව

ධම්මික දසනායක මහතා රජයේ අධිනීතිඥයෙක් ලෙස 1989 වසරේ දී නීතිපති දෙපාර්තමේන්තුවේ සේවයට එක් වී ගාල්ල, කොළඹ, ගම්පහ, රත්නපුර, හලාවත, පානදුර, මීගමුව සහ අවිස්සාවේල්ල ඇතුළු මහාධිකරණ රැසකම රජය වෙනුවෙන් නඩු කටයුතු මෙහෙයවා තිබේ. තව ද, ශ්‍රේෂ්ඨාධිකරණය ඉදිරියේ පවරන ලද මූලික අයිතිවාසිකම් කඩවීම් පිළිබඳ නඩු කටයුතු මෙන්ම ඇපැල් අධිකරණය ඉදිරියේ පවරන ලද අපරාධ නඩු අභියාචනා රැසක්ම සඳහා එතුමා රජය වෙනුවෙන් පෙනී සිට ඇත.

1994 දී, පාර්ලිමේන්තුවේ සහකාර මහ ලේකම්වරයා ලෙස සිය පාර්ලිමේන්තු වෘත්තීය දිවිය ආරම්භ කළ ධම්මික දසනායක මහතා, 2003 දී පාර්ලිමේන්තුවේ නියෝජ්‍ය මහ ලේකම් ධුරයට පත් වූ අතර, 2012 වර්ෂයේදී පාර්ලිමේන්තුවේ මහ ලේකම් ධුරයට උසස් විය.

දසනායක මහතා සිය දීර්ඝකාලීන පාර්ලිමේන්තු වෘත්තීය දිවිය තුළදී දේශීය සහ අන්තර්ජාතික ඇගයුමට ලක්වූ රාජ්‍යතාන්ත්‍රික කටයුතු රැසකට දායක වී ඇති අතර එතුමා අන්තර් පාර්ලිමේන්තු සංගමයේ (IPU), පොදුරාජ්‍ය මණ්ඩලීය පාර්ලිමේන්තු සංගමයේ (CPA) සහ සාර්ක් පාර්ලිමේන්තු සංගමයේ සමුළු බොහෝ ගණනක් සඳහා ශ්‍රී ලංකාව නියෝජනය කොට තිබේ.

පොදුරාජ්‍ය මණ්ඩලයීය පාර්ලිමේන්තු සංගමයේ පාර්ලිමේන්තු මහ ලේකම්වරයන්ගේ සංසදයේ දකුණු ආසියානු කලාපය නියෝජනය කරමින් කෘත්‍යාධිකාරී මණ්ඩලයේ සාමාජිකත්වය ද, 2010 - 2012 කාල වකවානුවේ දී දකුණු ආසියානු කලාපයීය මහ ලේකම්වරයන්ගේ සංසදයේ ලේකම් ධුරය ද, සාක් කථානායකවරයන්ගේ සහ පාර්ලිමේන්තු මන්ත්‍රීවරයන්ගේ සංසදයේ ලේකම්වරයා වශයෙන් ද කටයුතු කර ඇත. එසේම, පොදුරාජ්‍ය මණ්ඩල පදනම විසින් 2000 වර්ෂයේ දී පාර්ලිමේන්තු පරිපාලනය කටයුතු සඳහා වූ අධිශිෂ්‍යත්වයක් ද දසනායක මහතා වෙත පිරිනමා ඇත.

නීල් පරාක්‍රම ඉද්දවල මහතා වර්තමාන ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ නියෝජ්‍ය මහලේකම් සහ කාර්ය මණ්ඩල ප්‍රධානී තනතුරු හොබවයි.

කුරුණෑගල මලියදේව විද්‍යාලයේ කීර්තිමත් ආදි ශිෂ්‍යයෙකු වන ඉද්දවල මහතා සිය එල්.එල්.බී. (නීතිවේදී) උපාධිය සම්පූර්ණ කරන ලද්දේ කොළඹ විශ්ව විද්‍යාලයේ නීති පීඨයෙනි. 1988 දී ජේෂකර්ම සංස්ථාවේ නීති සහකාර නිලධාරියෙකු ලෙස සිය වෘත්තීය ජීවිතය ආරම්භ කළ ඒ මහතා 1994 දක්වා නීතිඥයෙකු ලෙස දිස්ත්‍රික් උසාවි ගණනාවක කටයුතු කළේය. 1995 දී අතිරේක දිස්ත්‍රික් විනිසුරුවරයෙක් ලෙස පත්වීම් ලැබූ ඒ මහතා ගාල්ල, අවිස්සාවේල්ල, මහව සහ කුරුණෑගල දිසා අධිකරණ වල දිසා විනිසුරුවරයෙක් ලෙස සේවය කළේය.



නීල් පරාක්‍රම ඉද්දවල
නියෝජ්‍ය මහලේකම් සහ
කාර්ය මණ්ඩල ප්‍රධානී
ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව

2003 වසරේදී නීල් ඉද්දවල මහතා ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ සහකාර මහ ලේකම් ධුරයට පත්වෙමින් පාර්ලිමේන්තු සේවයට පිවිසියේය. 2012 වසරේදී ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ නියෝජ්‍ය මහ ලේකම් ධුරයට පත් ඒ මහතා වර්තමානයේ එහි කාර්ය මණ්ඩල ප්‍රධානී තනතුරද හොබවන්නේය.

පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ මෙන්ම අධිකරණ සේවය සහ නීති ක්ෂේත්‍රය පිළිබඳ හසළ දැනුමක් ඇති විද්වතෙක් වන ඉද්දවල මහතා පොදුරාජ්‍ය මණ්ඩලයීය පාර්ලිමේන්තු සංගමය මඟින් ප්‍රකාශයට පත් කරන The Parliamentarian සඟරාව සඳහා ශ්‍රී ලංකාව වෙනුවෙන් සම්පත් දායකත්වය සපයන අතර ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ වාර්ෂික පර්යේෂණ ශාස්ත්‍රීය සංග්‍රහයේ ප්‍රධාන සංස්කාරක ලෙසද කටයුතු කරයි. එතුමා නීතිය පිළිබඳ පළ කෙරෙන ශාස්ත්‍රීය සංග්‍රහයන් ගණනාවකටද සිය දායකත්වය සපයා තිබේ.

## කතුවැකිය

# ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ සූදානම

දින හැටහතකට පසු මේ වන විට රට ඇඳිරි නීතියෙන් මිදී තිබේ. අනු ක්‍රමයෙන් රට යළි සාමාන්‍ය තත්ත්වයට පත් කිරීමට රජය හා සෞඛ්‍ය අංශ මේ වන විට මහත් පරිශ්‍රමයක් දරමින් සිටී. කෙසේ නමුත් නිරෝධායන පනත අනුව ලෝක ව්‍යාප්ත වසංගතයකදී රට තුළ ඒ සම්බන්ධව සිටින නිසි බලධාරියා වන සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්වරයා පවසන අන්දමට තවමත් රෝගයේ අවදානම කිසිසේත්ම පහව ගොස් නැත.

කෝවිඩ් 19 වසංගත තත්ත්වය හේතුවෙන් හදිසි සහ අත්‍යාවශ්‍ය කටයුතුවලට පමණක් සීමා කොට තිබූ ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ මහ ලේකම් කාර්යාලයේ කටයුතු පසුගිය මැයි මස 11 වැනිදා සිට යළි යථා තත්ත්වයට පත් කර ඇත. ඒ අනුව පාර්ලිමේන්තුවේ මහ ලේකම් ධම්මික දසනායක මහතා ඇතුළු දෙපාර්තමේන්තු ප්‍රධානීන් අතර පැවැති සාකච්ඡාවකදී තීරණය කළ පරිදි විශේෂ රාජකාරි දින පැවරුම් ලැයිස්තුවකට අනුව අනෙකුත් කාර්ය මණ්ඩල සේවයට වාර්තා කිරීම සිදුවේ. එහෙත් සියලු දෙනා එකවර සේවයට කැඳවීමක් සිදු කිරීමට රජයේ රෙගුලාසි අනුව තවමත් අවසර නැත. එමෙන්ම අවසර ලත් කාර්ය මණ්ඩලය හැර වෙනත් බාහිර පුද්ගලයින් පාර්ලිමේන්තු පරිශ්‍රයට ප්‍රවේශවීම සීමා කර තිබේ.

පාර්ලිමේන්තුවේ මීළඟ අභියෝගය සමාජ දුරස්ථභාවයට අදාළ රෙගුලාසින්ට අනුකූලව පාර්ලිමේන්තු රැස්වීම් හා අනෙකුත් කමිටු රැස්වීම් පැවැත්වීමය. ඉදිරියේදී පැවැත්වීමට නියමිත මහ මැතිවරණයෙන් පසුව තේරී පත්වන පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් ඒ සම්බන්ධව පක්ෂ නායකයන් සමඟ සාකච්ඡා කර තීරණයක් ගත යුතු වනු ඇත. පාර්ලිමේන්තු මහ ලේකම් කාර්යාලය ඒ සඳහා අවශ්‍යවන පහසුකම් සැලසීමට මේ වන විටත්, දීර්ඝ ප්‍රයාණයක නිමග්න වෙමින් සිටී.

කොරෝනා වසංගතය ලොව බොහෝ රටවලට එල්ල කර ඇති බලපෑම හමුවේ එම රටවල පාර්ලිමේන්තු ඩිජිටල් තාක්ෂණය වෙත යොමු වීමට පියවර ගෙන ඇත. මේ අතරින් වෙස්ට්මිනිස්ටර් සම්ප්‍රදාය අනුගමනය කරනු ලබන බ්‍රිතාන්‍යයේ පාර්ලිමේන්තුව ප්‍රමුඛවම ඉදිරියට පැමිණ ඇත. එහි මහජන මන්ත්‍රී මණ්ඩලයේ වසර 700 ක ඉතිහාසය තුළ එරට මන්ත්‍රීවරුන්ට ZOOM තාක්ෂණය ඔස්සේ සිය මැතිවරණ කොට්ඨාසයේ සිට පාර්ලිමේන්තුව හා සම්බන්ධවීමටත්, අමාත්‍යවරුන් වෙත ප්‍රශ්න යොමු කිරීමටත් හැකියාව ලැබී තිබේ. සමාජ දුරස්ථභාවයට අදාළ රෙගුලාසි අනුව මහජන මන්ත්‍රී මණ්ඩලයේ සභා ගර්භය තුළ අසුන් පැනවූයේ මන්ත්‍රීවරුන් 50 දෙනෙක්ට පමණි. එබැවින් දෙමහුන් ක්‍රමයට ඩිජිටල් තාක්ෂණය ඔස්සේ මන්ත්‍රීවරු තම අදහස් දක්වන අතර ප්‍රශ්න විමසති.

කෝවිඩ් ව්‍යසනය හමුවේ රට සාමාන්‍ය තත්ත්වයට පත්වන තෙක්, නව වැනි පාර්ලිමේන්තුවේ රැස්වීමද ඩිජිටල් තාක්ෂණය යොදා ගනිමින් දෙමුහුන් ක්‍රමයට පැවැත්වීම සිදුවනු ඇත. ඒ සඳහා වන මූලික සැලසුම් සැකසීමට අවධානය යොමුකර ඇති පාර්ලිමේන්තු මහ ලේකම් කාර්යාලය මන්ත්‍රීවරුන්ට අසුන් පැනවීම ඇතුළු අනෙකුත් කටයුතු සිදු කිරීම සඳහා මේ වන විට අධ්‍යයනයක යෙදී සිටියි. කෙසේ වෙතත්, මේ පිළිබඳව අවසන් තීරණයක් ගැනීම මීළඟ පාර්ලිමේන්තුවේ පක්ෂ නායකයන් සහ මන්ත්‍රීවරුන් විසින් සිදු කරනු ලැබේ.

**සන්නිවේදන දෙපාර්තමේන්තුව,**
**ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව,**
**ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ,**
**ශ්‍රී ලංකාව**

දුරකථනය : +94 11 2777100
ෆැක්ස් : +94 11 2777227

Parliament of Sri Lanka @ParliamentLK @slparliament Parliament of Sri Lanka

# ඡායා ගැලරිය

## තිරසර හෙට දවසක්-සෞඛ්‍යාරක්ෂිත පාර්ලිමේන්තුවක්





## හිටපු ගරු අමාත්‍ය ආරුමුගම් තොණ්ඩමන් මැතිතුමන්ගේ දේහයට පාර්ලිමේන්තුවේදී අවසන් ගෞරව





## ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව ස්වාධීන කොමිසම් සභාවල ප්‍රගතිය සමාලෝචනයට රැස්වෙයි





## පාර්ලිමේන්තුවේ ව්‍යවස්ථාදායක දෙපාර්තමේන්තුවේ භූමිකාව පිළිබඳව දැනුමෙන් බලගැන්වෙමු



